(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 41.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 ඔක්තෝබර් මස 19 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0334/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් පළාත් සභාවේ සමස්ත වාර්ෂික වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය නියෝජනය කරමින් මෙම එක් එක් පළාත් සභාවට තෝරා පත් කරගෙන ඇති වත්මන් මන්ත්‍රීවරුන්ගේ නම්, උපන්දිනයන් සහ දේශපාලන පක්ෂ කවරේද;

(ii) පළාත් සභා මන්ත්‍රීවරයකුට හිමි ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0407/'10

2.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, රක්වාන මැතිවරණ කොට්ඨාසයේ, ගොඩකවෙල නගරය තුළ ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇති ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ජල යෝජනා ක්‍රමය මඟින් ජලය ලබා දෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් පානීය ජලය සපයන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ජල යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) එම ජල යෝජනා ක්‍රමය අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0441/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ භටයින්ට දැනට ගෙවනු ලබන්නේ විශ්‍රාම වැටුපෙන් 65% ක් බවත්;

(ii) මහින්ද චින්තන වැඩ සටහන අනුව එය 85% තෙක් ඉහළ නැංවිය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහින්ද චින්තන වැඩ සටහන අනුව සිදු කළ යුතු එම ඉහළ නැංවීම මේ වන තෙක් ක්‍රියාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එය ක්‍රියාත්මක කරන දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0542/'10

4.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කාරතීව් රෝහලට අයත් ගිලන් රථය පසුගියදා නාඳුනන පිරිසක් විසින් ගිණි තබා විනාශ කළ බවත්;

(ii) එම නිසා රෝහලේ අසාධ්‍ය රෝගීන් සහ ගර්භණී මව්වරුන් හදිසි ප්‍රතිකාර සඳහා වෙනත් රෝහලකට රැගෙන යෑමේ අපහසුතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කාරතිව් රෝහලට ගිලන් රථයක් ලබාදීමේ අවශ්‍යතාව පිළිබඳව අම්පාර දිස්ත්‍රික් සංවර්ධන සහ සම්බන්ධීකරණ කමිටුව මඟින් අදාළ බලධාරීන් දැනුවත් කර තිබුණත් මේ දක්වා ගිලන් රථයක් ලබා දීමට පියවර ගෙන නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම රෝහලට නොපමාව ගිලන් රථයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0559/'10

5.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට, 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0560/10

6.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස.තො.ස. ආයතනයේ සිල්ලර ගබඩා පැය 24 පුරා විවෘතව තැබූ කාල සීමාවේදී එම ආයතනය භාරව කටයුතු කළ අමාත්‍යවරයා කවරෙක්ද;

(ii) එම අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ජනාධිපති ලේකම්ගේ අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අනුමත නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු නාමයන් කවරේද;

(iii) එම තනතුරු හෙබවූ නිලධාරීන්ගේ නම්, ලිපිනයන්, ලැබූ වැටුප් හා දීමනාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍යවරයා අමාත්‍ය පදවිය දැරූ කාල සීමාවේදී ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා එම අමාත්‍යාංශයෙන්, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් හා ස.තො.ස වැනි අනුබද්ධ සමාගම්වලින් අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, දැරූ තනතුරු, වැටුප්, දීමනා සහ ලැබූ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීමට පෙර සේවය කළ ආයතන හා දැරූ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0603/'10

7.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂවලදී;

(i) කොළඹ වරායට පැමිණි නැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොළඹ වරාය වාර්ෂිකව මෙහෙයවන ලද භාණ්ඩ බහාලුම් ප්‍රමාණය කොපමණද;

(iii) කොළඹ වරාය ඉපැයූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) ඉදිරි වර්ෂවලදී කොළඹ වරායේ ඉපැයුම් වර්ධනය කිරීම සඳහා යෝජිත වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0604/'10

8.

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා සිටින කිරි ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 හා 2009 වර්ෂයන්හිදී දේශීය කිරි නිෂ්පාදනය ලීටර් මිලියන කොපමණද;

(iii) එම කිරි නිෂ්පාදිතයන් ඉහත එක් එක් වර්ෂයේ ජාතික කිරි අවශ්‍යතාවයට දායක වූ ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කවරේද?

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කිරි ගොවීන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) කිරි කර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) වතුකරයේ කිරි ගොවීන්ගේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ සැළසුමක් පවතින්නේද;

(iv) එසේ නම්, ඒ කවරේද?

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලීසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඇමති ආරක්ෂක අංශ නිලධාරීන් යොදවා ඇත්තේ වෙන කවුරුන් වෙනුවෙන්ද;

(iii) එසේ ලබාදී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා හැර අනෙකුත් අයට මේ වන විට ලබාදී ඇති ඇමති ආරක්ෂක අංශ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ ආරක්ෂාව තවමත් ලැබෙන පරාජිත අපේක්ෂකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද සහ ඔවුන් කවර ප්‍රදේශවලින්ද;

(iii) එලෙස යොදවා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සඳහා ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ, විනිසුරුවන්ගේ ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරී සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0412/’10

10.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, වොක්ෂෝල් වීදියේ, අංක 175 සී කොටසෙහි පිහිටි වර්ග අඩි 2,227කින් යුත් ගබඩාව කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ අංක 345 ලිපිනයැති ග්ලෝබල් ටී බැගස් සමාගමට මාසික කුළිය රු. 30,065/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) බදුකරු විසින් අදාළ ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත ගබඩාව නැවත ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වගකිව යුත්තේ කවරුන්ද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0442/’10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දිනවලදී පොසීඩන් ලීඩර් (Poseidon Leader) නෞකාව මගින් මෙරටට ගෙන එන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම නෞකාව අයත් සමාගමේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නෞකාව මඟින් ගෙන්වන ලද වාහනවල වර්ගයන්හි නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වාහන පාවිච්චි කරන ලද (Recondition) ඒවාද; නැතහොත් පාවිච්චි නොකළ අලුත්ම තත්ත්වයේ (Brand new) ඒවාද;

(iii) එම එක් එක් වාහනයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම වාහන නැව්ගත කර ඇති දිනය කවදාද;

(ii) ඒවා අයත් සමාගම්වල නම් කවරේද;

(iii) එම වාහන මෙරටට ගෙන්වන ලද අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0544/10

12.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරනු ලබන නිල හැඳුනුම්පත් හිමි වයෝවෘද්ධ පුද්ගලයන් සඳහා ලබා දී ඇති වරප්‍රසාද සහ සහන කවරේද;

(ii) එකී හැඳුනුම්පතක් හිමි අඩු ආදායම්ලාභී පවුලක වයෝවෘද්ධ පුද්ගලයෙකුට මාස්පතා යම් මුල්‍යාධාරයක් ලබාදීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(iii) මහින්ද චින්තන ප්‍රතිපත්ති අනුව ඉහත හැඳුනුම්පත්ලාභී වයෝවෘද්ධ අයෙකුට ලබා දෙන වරප්‍රසාද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල හැඳුනුම්පත් ලබා දී ඇති අයට ලබා දෙන වරප්‍රසාද, පහසුකම් හා සහනදායි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කර ඇති චක්‍ර ලේඛයන් කවරේද;

(ii) එම චක්‍රලේඛයන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන කවරේද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0413/'10

13.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වොක්ෂෝල් වීදියේ, අංක 175 F කොටසෙහි පිහිටි වර්ග අඩි 5079කින් යුත් ගබඩාව, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ පිහිටි සමර්විල් කම්පැනි නම් වූ සමාගමට, මාසික කුළිය රු. 66,027/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් අදාළ බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැතිනම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) මෙම බදු ගෙවීමේදී නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වගකිව යුත්තෝ කවරුන්ද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0458/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ක්‍රියාත්මක වන මුළු ගැන්ට්‍රි දොඹකර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ කොපමණ කලකට ඉහත ද;

(iii) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් පැයකදී සිදු කරන ලද බහළු මෙහෙයුම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සිංගප්පූරුව, හොංකොං, ඩුබායි, මැලේසියාව සහ ඉන්දියාවේ මුම්බායි සහ චෙන්නායි වරායවල් සමග සැසඳීමේදී මෙහි තත්ත්වය කුමක්ද;

(v) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී සහ එක් එක් මාසයේදී කොළඹ වරාය විසින් මෙහෙයවන ලද බහළු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) බහළු මෙහෙයවීම සඳහා ගැන්ට්‍රි දොඹකර අටක් මිලදී ගැනීම සඳහා කොළඹ වරාය විසින් මුදල් ආයෝජනය කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙහි සමස්ත පිරිවැය කොපමණද;

(ii) ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ආදායම වර්ධනය කරන ආකාරය කවරේද;

(v) ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානයේ කරන ගෙවීම් දක්වා සියල්ල ඇතුළත් සමස්ත ව්‍යාපෘතියේ මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) මෙම අනවශ්‍ය සහ අවාසිදායක ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ලබාගත් තරඟකාරී මිල ගණන් සමග සන්සන්දනය කිරීමෙන් අනතුරුව ඉහත ව්‍යාපෘතිය ඇරඹීම සාධාරණීකරණය කිරීම සඳහා කරුණු එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0460/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ඇති බන්ධනාගාර නියාමක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද:

(ii) එම පුරප්පාඩු පවතින බන්ධනාගාර කවරේද;

(iii) රජය එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන්නේ ද;

(iv) එසේ නම්, ඒ කුමන පදනමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය රජය විසින් බඳවාගන්නා ලද බන්ධනාගාර නියාමකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා පටිපාටිය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන (2011),— 2011 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"හිංසාවෙන් සතුන් ආරක්ෂා කිරීම, සතුන් කෙරෙහි ප්‍රජාව තුළ කරුණාව, දයාව සහ වගකිවයුතු හැසිරීම වර්ධනය කිරීම; ජාතික සත්ව සුභසාධන අධිකාරියක් පිහිටුවීම; පොදුවේ සත්ව සුභ සාධනය සඳහා ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු ජානක බණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය(අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 ඔක්තෝබර් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 ඔක්තෝබර් මස 06) [1]

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව, 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| අග්‍ර විනිශ්චයකාරවරයා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් හා අභියාචනාධිකරණයේ සභාපතිවරයා | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| අග්‍ර විනිශ්චයකාරවරයා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් හා අභියාචනාධිකරණයේ සභාපතිවරයා | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍ර විනිශ්චයකාරවරයාට සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අග්‍ර විනිවිනිශ්චයකාරවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ ආඥාව,— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වැනි වගන්තිය යටතේ ඉඩම්, ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 1981 අප්‍රේල් මස 16 දිනැති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද ආඥාව අනුමත කළ යුතු ය.

*8.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 1),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වැනි වගන්තිය යටතේ මහවැලි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2000 මැයි මස 04 දිනැති අංක 1130/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*9.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 2),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදනු ලදුව,

2007 මාර්තු මස 06 දිනැති, අංක 1487/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*10.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 3),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2007 මාර්තු මස 09 දිනැති, අංක 1487/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*11.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව රු. 100,000,000 සිට රු. 960,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*15.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*17.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---